Archaeological Society of Sri Lanka

# පුරාවිදු පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

14 වෙළුම
1 කලාපය
2018
ජනවාරි-මාර්තු

## පළමුවැනි පුරාවිද්‍යා ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය 2018 පෙබරවාරි 15

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය සංවිධානය කරනු ලබන 'පළමුවැනි පුරාවිද්‍යා-ඉතිහාස පර්යේෂණ සම්මන්ත්‍රණය' 2018 වර්ෂයේ පෙබරවාරි මස 15 දින කොළඹ දී පැවැත්වේ. **මීට පුරාවිද්‍යාව හා ඉතිහාසය පිළිබඳ විවිධ මාතෘකා ඔස්සේ ඉදිරිපත් කෙරෙන පර්යේෂණ පත්‍රිකා ඇතුළත් වනු ඇත.**

සම්මන්ත්‍රණය සඳහා සංගමය මගින් සිදු කළ පත්‍රිකා කැඳවීමට ප්‍රතිචාර ලෙස විවිධ මාතෘකා යටතේ පර්යේෂකයන් වෙතින් විස්තීර්ණ සාරාංශ 74ක් ලැබී තිබේ. ඒ අතරින් සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කිරීම සුදුසු පර්යේෂණ පත්‍රිකා තෝරා ගැනීම සඳහා පත්‍රිකා සමීක්ෂණය කිරීම මේ වන විට සිදුකෙරෙමින් පවතී. 2017 දෙසැම්බර් මාසය අවසන් වන විට සාරාංශ සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කිරීම සඳහා පිළිගත් නොපිළිගත් බව දැනුම් දෙනු ලැබේ. ඒ අනුව සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරනු ලබන පත්‍රිකා ප්‍රමාණය තීරණය වනු ඇත.

මෙම සම්මන්ත්‍රණය මෙරට පුරාවිද්‍යාව හා ඉතිහාස විෂය හා සම්බන්ධව වැදගත් අධ්‍යයන ඉදිරිපත් කරනු ලබන සම්මන්ත්‍රණයක් වනු ඇතැයි සංගමය අපේක්ෂා කරයි.

එයට සහභාගි වන ලෙස සංගමයේ සාමාජිකයින් වෙත මෙමගින් ආරාධනා කරමු. ඒ සඳහා සහභාගි වීමට කැමැත්ත දක්වන සාමාජිකයින් සංගමයේ ජනවාරි මාසයේ පැවැත්වෙන රැස්වීමේදී අදාළ ලියාපදිංචි ගාස්තුව ගෙවා සහභාගිත්වය තහවුරු කළ යුතු බවද මෙමගින් දන්වා සිටිමු. මෙම ලියාපදිංචි වීමේ ගාස්තුවට මුද්‍රිත පත්‍රිකා එකතුව, දිවා ආහාර හා තේ පැන් ඇතුළත්ය.

- පත්‍රිකා ඉදිරිපත් කරන්නන් රු. 800/=
- සහභාගි වන්නන් සඳහා රු. 600/=

සම්මන්ත්‍රණයට සහභාගි වීම පිළිබඳ වැඩි විස්තර සඳහා මුදිත කරුණාමුනි (071-2287497) හෝ ධනේෂ් විසුම්පෙරුම (071-4310794) අමතන්න.

## ඔබේ සාමාජිකපතට අයැදුම් කළාද?

යාවජීව සාමාජිකයන් සඳහා ලබාදෙන සාමාජිකපත ලබාගැනීම සඳහා ඔබ මේ දක්වා අයැදුම් කර නොමැතිද? ඒ සඳහා කඩිනමින් අයැදුම් කරන මෙන් ඉල්ලා සිටිමු.

පහත වෙබ් ලිපිනයෙන් බාගත කරගත් අයැදුම්පත* පුරවා, ඡායාරූපය හා මුදල් සමඟ ජනවාරි 31 දිනට පෙර සමලේකම්වරුන් වෙත ලබාදෙන මෙන් ඉල්ලා සිටිමු.

www.archaeology.org.lk/cardform.pdf

* අයැදුම්පත සැප්තැම්බර් මස පුවත් හසුන සමඟ ද එවා ඇත.

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස දෙක තුළ පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **ජනවාරි 07 ඉරිදා ප.ව. 2.30ට**

අධ්‍යයන චාරිකාව :
පැරණි ස්මාරකයන්හි චිත්‍රගත සැරසිලි මෝස්තර

දේශක:
මහාචාර්ය සරත් ඥානසිරි මල්දෙනිය මහතා
(සෞන්දර්ය විශ්ව විද්‍යාලය)


- **පෙබරවාරි 15 බ්‍රහස්පතින්දා**

පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා
**පළමුවැනි ඉතිහාස හා පුරාවිද්‍යා පර්යේෂණ සම්මන්ත්‍රණය**

සහභාගි වීම පිළිබඳ විස්තර සඳහා වම්පස තීරුව බලන්න.

- පෙබරවාරි මසට නියමිත සාමාන්‍ය මාසික දේශනය නොපැවැත්වේ.
- මාර්තු මාසයේදී පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ විස්තර පසුව දැනුම් දෙනු ලැබේ.
- ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහළේ)
- දේශන පැවැත්වෙන දිනවල සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. වේලාව දැනුම් දෙනු ලැබේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

''ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය: පණස් වසරක ඉතිහාසය 1966-2016''
- විස්තර හා මිලදී ගත හැකි ආකාරය 4 වැනි පිටුවේ...



# කුරුණෑගල දිස්ත්‍රික් පුරාවිද්‍යාස්ථාන අධ්‍යයන චාරිකාව - නොවැම්බර් 2017



ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 2017/2018 වැඩසටහනේ සඳහන් වන දෙවන අධ්‍යයන චාරිකාව සඳහා තෝරාගන්නා ලද්දේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීම සඳහා දෙදින අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීමටය. ඒ අනුව පසුගිය නොවැම්බර් මස 18-19 දෙදින තුළ සංගමයේ සාමාජිකයන් 18 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මෙම චාරිකාව පැවැත්වීමට යෙදිණි.

එම චාරිකාවේදී පහත සඳහන් වන ස්ථාන අධ්‍යයනය කරන ලදි.

- **පනාවිටිය අම්බලම** - දඹදෙණිය, මැටියගනේට නුදුරින් පිහිටා ඇති මෙම අම්බලම මහනුවර යුගයේ පමණ ඉදි කළ එකකි. ගල් මත ඉදි කළ දැව පදනමක් මත ඉදි කර ඇති අම්බලම ලී කැටයම්වලින් විසිතුරු කර ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කර ඇත.
- **පඬුවස්නුවර** - පරාක්‍රමබාහු රජු දක්ඛිණදේශය පාලනය කරන අවධියේ, එනම් 12 වන සියවසේ ඉදි කළ පරාක්‍රමපුරය අද පඬුවස්නුවර සේ හැඳින්වේ. මෙහි ඇති ප්‍රධානතම පුරාස්ථානය වන්නේ දියඅගලකින් හා ගඩොලින් කළ ප්‍රාකාරයකින් වට වූ ස්ථානයක පිහිටා ඇති මාලිගා සංකීර්ණයක නටබුන්ය. මෙය පොලොන්නරුවේ රජමාලිගා හා සමාන සැලසුමකින් යුක්ත බව පැවසේ. මෙහි නිශ්ශංකමල්ල රජුගේ ශිලාලිපියක් සහිත ආසනයක් දැකිය හැකිය.

  මේ හැර විවිධ ආරාම සංකීර්ණ ගණනාවක නටබුන් පඬුවස්නුවර නටබුන් අතර දැකිය හැකිය. ඒවායේ ගඩොලින් කළ විවිධ ආරාමික ඉදිකිරීම් තිබේ. එමෙන්ම වර්තමාන පඬුවස්නුවර රජමහාවිහාර පරිශ්‍රයේ පිහිටි ඉදිකිරීම් අතර මහනුවර සමය දක්වා දිවෙන ටැම්පිට විහාරය, අනුරාධපුර සමයට අයත් ටැම් ලිපි, දළදාමාලිගය ලෙස හඳුන්වන පැරණි ගොඩනැගිල්ලක් හා චක්‍රවාලය ලෙස හඳුන්වන ඉදිකිරීම වැදගත් වේ.

  පඬුවස්නුවර හා අවට ප්‍රදේශවලින් හමු වී ඇති පුරාවස්තු තැන්පත්කර ඇති පුරාවිද්‍යා කෞතුකාගාරයද සාමාජිකයන්ගේ අධ්‍යයනයට ලක්විය.
- **පඬාවැව හා එහි සොරොව්ව** - පඬාවැව පිහිටා ඇත්තේ පඬුවස්නුවරට නුදුරුවය. බිඳී ගිය පැරණි විශාල වැවක බැම්ම හා රළපනාව එහි දැකිය හැකි අතර, සොරොව්වක නටබුන් දැකිව හැකිය. එම සොරොව්වේ සෙල්ලිපියක්ද හමු වේ.
- **නාතගනේ විහාරය** - වාරියපොල, මහකෙලියට නුදුරින් පිහිටා ඇති නාතගනේ පැරණි දාගැබ මේ වන විට ප්‍රතිසංස්කරණය කෙරෙමින් පවතී. එහි දැකිය හැකි ලෙන් විහාර අතරින් එකක මහනුවර සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමා හා චිත්‍ර දැකිය හැකිය.
- **කබල්ලෑලෙන පුරාණ විහාරය** - පොල්පිතිගමට නුදුරුව පිහිටා ඇති මෙම විහාරය කටාරම් කොටන ලද ලෙන් ගණනාවකින් සමන්විත වේ. බ්‍රාහ්මී ලෙන් ලිපි කිහිපයක්ද මෙහි දැකිය හැකිය. විහාරගෙය ලෙස භාවිත වන ලෙන මහනුවර සම්ප්‍රදායේ බුද්ධ ප්‍රතිමා සහ චිත්‍රවලින් සමන්විතය. පහළ මළුවේ දැකිය හැකි ස්තූපය අනුරාධපුර සමයට අයත් නිර්මාණයකි. යූප ගලකින් යුක්ත එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිසංස්කරණය කර තිබේ.
- **රුස්වෙහෙර රජමහා විහාරය** - රුස්වෙහෙර හෙවත් සැස්සේරුව අභය මුද්‍රාවෙන් යුක්ත විශාල ප්‍රමාණයේ හිටි බුදුපිළිමයක් පිහිටා ඇති නිසා ප්‍රකටව ඇති විහාරස්ථානයකි. ඒ හැර මෙහි කටාරම් කෙටූ ලෙන් ගණනාවක් ඇත. ඒ අතරින් ලෙන් දෙකක මහනුවර සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමා සහ චිත්‍ර නිර්මාණ දැකගත හැකිය. වෙනත් ශිලාමය අවශේෂද දැකගත හැකිය.
- **නිල්ලක්ගම බෝධිඝරය** - නිතලව ගමේ පිහිටා ඇති මෙම බෝධිඝරය අනුරාධපුර සමයේ පසු භාගයට අයත් නිර්මාණයකි. ගලින් කළ වේදිකා දෙකකින් යුක්ත මේ බෝධිඝරයේ වේදිකා වටා ඇති ශිලාමය ප්‍රාකාරය හා දොරටු කැටයම්වලින් යුක්තය. වේදිකා අතර වහලක් තිබූ බවට සාධක වේ. ශිලාලිපියක්ද දැකිය හැකිය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කර තිබේ.
- **කටුවන්නාව ආසනඝරය** - ආසනඝර යනු ආසනයක් වන්දනාව සඳහා යොදාගන්නා ලද ස්ථානයකි. කටුවන්නාවේ දැකිය කවාකාරව පිහිටා ඇති ශිලාමය කණුවලින් වට වූ මළුවක පිහිටා ඇති ආසන දෙකකින් යුක්ත ආසනඝරයකි. මෙය පිහිටා ඇත්තේ ගඩොලින් හා කළුගලින් කළ ප්‍රාකාරයකින් වටවූ භූමියකය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් 1960 දශකයේදී සංරක්ෂණය කර තිබේ.

මෙම අධ්‍යයන චාරිකාව සංවිධානය කරන ලද්දේ සම්බන්ධීකරණ ලේකම් සංජීවනී විද්‍යාරත්න මහත්මිය විසිනි. ඒ සඳහා සමලේකම් මුදිත කරුණාමුනි හා සංස්කාරක ධනේෂ් විසුම්පෙරුමගේ සහායද ලැබිණි.

# අපෙන් සමුගත් කලාභූෂණ කලාපති ධර්මසිරි කාරියවසම්



ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පැරණි සාමාජිකයෙකු හා ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙකු වූ කලාභූෂණ කලාපති ධර්මසිරි කාරියවසම් මහතා 2017 ඔක්තෝබර් 26 දා අභාවප්‍රාප්ත විය.

1924 අප්‍රේල් මස 14 දින මාතර වැලිගමදී උපන් කාරියවසම් ගමගේ ධර්මසිරි කලා ලෝකයේ ප්‍රකට වූයේ ධර්මසිරි කාරියවසම් යනුවෙනි. පෝරුතොට පාසැලින් හා මාරඹ ද්විභාෂික පිරිමි විදුහලින් පාසැල් අධ්‍යාපනය ලැබූ ඔහු ක්‍රමයෙන් චිත්‍රකරණය කෙරේ යොමු වී ඇත. 1949දී චිත්‍රකර්ම ගුරු විභාගයෙන් සමත් වූ ඔහු පසුව ජේ.ඩී.ඒ. පෙරේරාගේ මූලිකත්වයෙන් පැවැති රජයේ ලලිතකලාතනයේ චිත්‍ර අංශයේ පුහුණුව ලබන අතර, ඩේවිඩ් පේන්ටර් යටතේද චිත්‍ර හැදෑරීමට අවස්ථාව ලබයි.

1952 සිට 1982 දක්වා ධීවර අමාත්‍යාංශයේ ධීවර පර්යේෂණාගාරයේ (පසුව නාරා ආයතනය) ප්‍රධාන චිත්‍ර ශිල්පී ලෙස ධර්මසිරි කාරියවසම් මහතා කටයුතු කළේය. විශ්‍රාම ලැබීමෙන් පසු ලංකා කලා සංගමයේ චිත්‍ර කලාගුරුවරයෙකු ලෙස කලක් කටයුතු කර ඇති ධර්මසිරි කාරියවසම් විසින් චිත්‍ර මූර්ති උපදේශන සේවාවක්ද දිගු කලක් තිස්සේ කලාසෙවන නමින් සිදුකරගෙන ගොස් තිබේ.

ඒ මහතා දායක වූ නිර්මාණ ගණනාවකි. ඒ අතර, CEYFISH ලාංඡනය, North Star නෞකාවේ ලාංඡනය, ධීවර අභ්‍යාස විද්‍යාලයේ ලාංඡනය, ජලජ ජීවීන් පිළිබඳ අත්පොතක් සඳහා කළ චිත්‍ර නිර්මාණ, මුද්දර සඳහා කරදිය හා මිරිදිය ජලජ ජීවීන් හතරදෙනෙකුගේ රූප නිර්මාණය (1972) ආදී කටයුතු වේ. එසේම, ඔහු විසින් බෞද්ධ සිද්ධස්ථාන ගණනාවක චිත්‍ර පිටපත් කර තිබේ. මෙම චිත්‍ර යොදාගනිමින් ප්‍රදර්ශන කිහිපයක්ද පවත්වා ඇත. ඔහු විසින් කලාවට සිදුකරන ලද සේවාව ඇගයීම වෙනුවෙන් ධර්මසිරි කාරියවසම් 1992 වර්ෂයේදී කලාභූෂණ හා කලාපති සම්මානවලින් පිදුම් ලද්දේය.

**පුරාවිද්‍යා සංගමය සමඟ තිබූ සම්බන්ධය**

ධර්මසිරි කාරියවසම් මහතා විසින් ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය වෙනුවෙන් චිත්‍ර ප්‍රදර්ශන දෙකක් පවත්වා ඇති අතර ඒ 1991 වර්ෂයේදී පැවැති සංගමයේ රජත ජයන්තිය නිමිත්තෙන් පැවැති 'ශ්‍රී ලංකාවේ විහාර බිතු සිතුවම්' චිත්‍ර ප්‍රදර්ශනය හා 1996 යන වර්ෂයේදී පැවැති චිත්‍ර ප්‍රදර්ශනයයි. එසේම 2006 වර්ෂයේදී සංගමයේ 40 වන සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාත්මක උරුමය නම් ඡායාරූප හා චිත්‍ර ප්‍රදර්ශනයට ඒ මහතාද සම්බන්ධ විය. ඒ මහතා දිගුකලක් සංගමයේ කාරක සභිකයකු ලෙස කටයුතු කළ අතර, උපසභාපතිවරයකු ලෙස කටයුතු කළේය. 2009.03.29 වන දින සංගමය ඒ මහතා වෙනුවෙන් උපහාර උත්සවයක් පවත්වන ලද අතර, එහිදී උපහාර උපහාර දේශනයක් පවත්වා උපහාර තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදි.

(ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ගරු විධායක සභික **ඊ. කේ. හේමතිලක බණ්ඩාර** මහතා විසින් සකස් කරන ලද '**ධර්මසිරි කාරියවසම් සෞන්දර්යවේදියා**' නම් පත්‍රිකාව ඇසුරිනි.)

# ආචාර්ය අමරදාස වීරසිංහ



සංස්කෘති ප්‍රකාශනයේ ආරම්භක සංස්කාරකවරයෙකු හා ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ගරු සමලේකම් තනතුරක් දැරූ පී. වීරසිංහ මහතාගේ සොහොයුරා වූ ආචාර්ය අමරදාස වීරසිංහ මහතා පසුගිය ඔක්තෝබර් මාසයේදී අභාවප්‍රාප්ත විය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල විශේෂ උපාධිධාරියකු වූ ඒ මහතා, කලක් රුහුණ විශ්වවිද්‍යාලයේ සේවය කළ අතර, පසුකලක ඇමරිකාවේ සරසවියක සේවය පිණිස මෙරටින් බැහැරව ගියේය. හෙතෙම පෙන්සිල්වේනියා සරසවියෙන් ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධිය ලබාගත්තේය.

1953 වර්ෂයේදී අමරදාස වීරසිංහයන්ගේද මූලිකත්වයෙන් සංස්කරණය වන සංස්කෘති සඟරාව මෙරට ශාස්ත්‍රීය සඟරා අතර මුල් තැනක් ගත්තේය. 1970 දශකයේදී ඔහුගේ විදේශගතවීමෙන් පසුව එම සඟරාව අඩපණ වූ නමුත් යළි මෙරටට පැමිණීමෙන් පසුව සංස්කෘති සඟරාව යළි ආරම්භ කිරීමට කටයුතු කරන අතර, සංස්කෘති ප්‍රකාශන ආයතනය යළිත් ස්ථාපිත කිරිමේලා මූලික වෙයි. ඒ මහතා මියයන තුරුම එම කටයුතුවල යෙදී සිටියේය. ශාස්ත්‍රීය ලිපි ලේඛන රචනා කිරීමට අමතරව, අමරදාස වීරසිංහ විසින් රචනා කළ සෙසු ශාස්ත්‍රීය ග්‍රන්ථ අතර, කාලය හා සමාජය (1959), රජ්ජුරුවෝ නිරුවතින් (1967), ජනශ්‍රැති කථා (1967), සිංහල ජනශ්‍රැතිය හැදෑරීම (1986), කැඩපතක් නැති ජාතිය (2009) හා සිංහල නාට්‍ය හැදෑරීම (2009) වැනි කෘති වේ.

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ඉතිහාසය සැකසීමේදී වැදගත් වූ සංස්කෘති ප්‍රකාශන ආයතනය සතු පී. වීරසිංහ එකතුවේ ඇති ලිපිලේඛන එකතුවක් පරිශීලනය සඳහා අවසර ලබාදීම පිළිබඳව අමරදාස වීරසිංහ මහතාට අපගේ ප්‍රණාමය හිමි වේ. සංගමය පිළිබඳව මේ දක්වා අනාවරණය කරගෙන ඇති පැරණිම ලිපිලේඛන එකතුව වන එම ලිපිලේඛන සංගමයේ ඉතිහාසය සම්බන්ධව වැදගත් තොරතුරු සමුදායක් අනාවරණය කරගැනීමට අපකාරී විය.

- **ධනේෂ් විසුම්පෙරුම (සංස්කාරක)**

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක


ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල - archaeology.org.lk@gmail.com

වෙබ් අඩවිය - www.archaeology.org.lk

- **ගරු සභාපති**
  මහින්ද මලලසේකර 072-3322411
- **ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති**
  රංජිත් හේවගේ 071-1712894
- **ගරු උප සභාපති**
  කාවන් රත්නතුංග 071-7072020
- **ගරු සමලේකම්වරු**
  මුදිත කරුණාමුනි 071-2287497
  යොහාන් පෙරෙයිරා 077-9651201
- **ගරු සම්බන්ධීකරණ ලේකම්**
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- **ගරු භාණ්ඩාගාරික**
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- **ගරු සංස්කාරක**
  ධනේෂ් විසුම්පෙරුම 071-4310794


## නිවේදන

- සාමාජික අයඳුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- පුරාවිද්‍යා සංහිතා 2, 3 හා 5 කලාප සංගමයේ රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් Subject ලෙස Add යොදා, සාමාජික අංකය සඳහන් කර ඉහත සඳහන් සංගමයේ ඊ-මේල් ලිපිනයට ඊ-මේල් පණිවුඩයක් එවන්න.

## පුරාවිදූ පුවත් සංස්කරණය


ධනේෂ් විසුම්පෙරුම
ගරු සංස්කාරක
dhaneshw@gmail.com


# සංගමයේ පණස් වසරක ඉතිහාසය කෘතිය

**'ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය: පණස් වසරක ඉතිහාසය 1966-2016' කෘතිය පසුගිය දෙසැම්බර් මස 10 වන දින පැවැති සංගමයේ මාසික රැස්වීමේදී එළිදක්වන ලදි. එය සංගමයේ වසර පණහක කටයුතු පිළිබඳව ලේඛනගත සාධක පදනම් කරගනිමින් සිදුකරනු ලද ශාස්ත්‍රීය විමර්ශනයකි.**

සංගමයේ හිටපු සමලේකම්වරයෙකු වන වර්තමාන ගරු සංස්කාරක ධනේෂ් විසුම්පෙරුම මහතා විසින් මෙම කෘතිය සම්පාදනය කර ඇත.

මෙම කෘතිය පහත සඳහන් පරිච්ඡේදවලින් හා උපලේඛනවලින් යුක්තය.




1 හැඳින්වීම
2 සංගමයේ ආරම්භය
3 සාමාජිකත්වය හා නිලධාරි මණ්ඩලය
   අ. සාමාජිකත්වය
   ආ. නිලධාරි මණ්ඩලය
4 සංගමයේ රැස්වීම්
5 සංගමයේ ප්‍රධාන කටයුතු
   අ. දේශනමාලාව
   ආ. ප්‍රකාශන
   ඇ. සම්මන්ත්‍රණ
   ඈ. සංවත්සර වැඩසටහන්
   ඉ. ප්‍රදර්ශන
   ඊ. ගවේෂණ හා අධ්‍යයන චාරිකා
   උ. වෙනත් වැඩසටහන්
   ඌ. ජාතික මට්ටමේ මැදිහත්වීම්
6 සංගමයේ දේපොළ හා මූල්‍ය කටයුතු
7 පසුවදන: පණස්වන සංවත්සරයෙන් පසු

<u>උපලේඛන</u>

1වන උපලේඛනය: ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ව්‍යවස්ථාව
2වන උපලේඛනය: සාමාජික නාමලේඛනය (2017 නොවැම්බර් දක්වා)
3වන උපලේඛනය: ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ප්‍රධාන නිලධාරින්
4වන උපලේඛනය: සංගමයේ දේශන (1969-2016)
5වන උපලේඛනය: ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා සඟරාවේ ලිපි නාමාවලිය

**මෙම කෘතිය මිල නියම කර ඇත්තේ රු. 350කට වන අතර, සාමාජිකයින් සඳහා රු. 300ක මිලකට ලබාදීමට තීරණය කර තිබේ. මුද්‍රණය කර ඇත්තේ සීමිත පිටපත් සංඛ්‍යාවක් පමණක් බැවින් ඔබේ පිටපත කඩිනමින් වෙන් කරගන්නා මෙන් ඉල්ලා සිටිනු ලැබේ. තැපැල් මගින් ලබාගැනීම පිළිබඳ විමසීම් සඳහා සංස්කාරක ඇමතිය යුතුය (දුර: 071-4310794).**

**මෙම මුද්‍රණයට පෙර මුදල් ගෙවා වෙන්කරගෙන ඇති සාමාජිකයින්ට අදාළ ලදුපත ඉදිරිපත් කිරීමෙන්, සංගමයේ රැස්වීම් දිනයකදී භාණ්ඩාගාරික ලක්ෂ්මන් රත්නායක වෙතින් හෝ සංස්කාරක ධනේෂ් විසුම්පෙරුම වෙතින් ඔවුන්ගේ පිටපත් ලබාගත හැකිය.**


**පුරාවිදූ පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.



**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.